# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක 9,024—1942ක්වූ ඔක්තෝබර් මස 23 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 13,789, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1942ක්වූ දෙසැම්බර් මස 16වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට වැලිමඩ ගම්සභා උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ උඩුකිඳ කොට්ඨාශයේ දෙහිවිනිපලාත කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි හතරක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ අංක 430. ගම—දංඕවෙල.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | ගල්අඹුලනගින්නේපඤන | උඩපුස්සැල්ලාවේ තිකගොල්ලවත්තේ පදිංචි මුතුකරුප්පන් වේලාසිදන් | හේ | .. 0 0 18 |
| 80 | තිකගොල්ලේවත්ත | එම .. .. .. | එම | .. 0 3 6 |
| 92 | මලපොලහේන .. | පන්නලවෙල පදිංචි (අප්පුහාමිගේපුත්) අක්මීමන ඔබඩමුදලිගේ බන්ඩා | පතන | .. 0 2 4 |
| 101 | එම .. | (සිරිබිඳුනගේ දුවවන) අක්මීමන ඔබඩමුදලිගේ බංඩාර මැණිකේ | එම | .. 0 2 5 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම්බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින කෑගල්ලේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 13,790, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1942ක්වූ දෙසැම්බර් මස 16වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට වැලිමඩ ගම්සභා උසාවියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කේ උඩුකිඳ කොට්ඨාශයේ මැදපලාත කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි හතරක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ අංක 464. ගම—කඩදෙරගම (කොටසක්).

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 153 | මොටමොලේඅඹගහවතත | වැලිමඩ පදිංචි ජී. එච්. චාර්ලිස්සිංඤෝ .. .. | හේන | .. 5 0 37 |
| 155 | එම .. | හල්ගරන්ඔය සැන්ට් ලියොනාර්ඩ්වත්තේ පදිංචි ආර්. ඇම්. අනුලාවතී කුමාරිහාමි | එම | .. 3 3 27 |
| 166 | තැබෑරුන්වත්ත .. | කඩදෙරගම පදිංචි (1) ඇම්. කේ. බී. සුගතදාස, (2) ඇම්. කේ. බී. සීලවතී | එම | .. 0 0 18 |
| 167 | පච්චමල්වත්ත .. | (1)බොරලන්දේ පදිංචි පීරිස් සමරවික්‍රම, (2) කඩදෙරගම පදිංචි බෙබිනෝනා සමරවික්‍රම, (3) බොරලන්දේ පදිංචි පී. ඇම්. සමරවික්‍රම, (4) බොරලන්දේ පදිංචි ඇලිස්නෝනා සමරවික්‍රම සහ තවත් අය | එම | .. 0 3 1 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින කෑගල්ලේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

**No. 13,791, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1942ක්වූ දෙසැම්බර් මස 11වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 10ට හල්දෙන සැසි බංගලාවේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හෝ නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ වියලුව කොට්ඨාසයේ වියලුව කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි හයක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ අංක 353. ගම—පල්ලේකන්ද.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 318 | අරාවිහේන .. | පල්ලේකන්දේ පදිංචි දඹගහවත්තේ එපිටගෙදර බින්දුවා .. | හේන | .. 0 3 22 |
| 319 | එම .. | උඩවෙල පදිංචි පරගහම්බේගෙදර සිරිමලී .. .. | එම | .. 0 3 6 |
| 367 | කොත්තොටුගොල්ලේ හේන | (1) පල්ලේකන්දේ පදිංචි මුතුවාදුරයාලාගේ ගරුවා විදුනදුරයා, (2) රත්නායකමුදියන්සේලාගේ අප්පුහාමි වෙදරාල | එම | .. 1 2 8 |
| 403 | ඌරුචිත්තේහේන, දඹ ගස්වත්තේහේන | පල්ලේකන්දේ පදිංචි දඹගහවත්තේඋඩගෙදර ඩිංගිරී .. | එම | .. 1 0 21 |
| 476 | මඩමේවත්ත .. | පල්ලේකන්දේ පදිංචි මඩමේවත්තේගෙදර දේවයා .. | වත්ත | .. 0 0 12 |
| 690 | එම .. | පල්ලේකන්දේ පදිංචි කිඹුල්ලෑවේමැදගෙදර හුඩුවා .. | එම | .. 0 0 22 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින කෑගල්ලේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

**No. 13,792, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1942ක්වූ දෙසැම්බර් මස 16වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට වැලිමඩ ගම්සභා උසාවියේදී වෙන්දේසි කර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. ඌව දිසාවේ බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොඩාසයේ යටිපලාත කෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි හතක්.

ලංකාමැනීමේ ගම් සිතියමේ නො. 447. ගම—කුරුදුගොල්ල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 48 | වදගොල්ලේගොඩපතන | අඹගස්දෙණේ පදිංචි වීරසුන්දරමුදියන්සේලාගේ තින්මැනිකේ | පතන | .. 1 0 10 |
| 51 | එම .. | අඹගස්දෙණේ පදිංචි පොල්වත්තේගොල්ලගේ බඹුන්අප්පු .. | එම | .. 0 0 31 |
| 55 | එම .. | (1) වැලිමඩ පදිංචි වීරසුන්දරමුදියන්සේලාගේ කලාකුමුර, (2) එම එම අප්පුහාමි | එම | .. 0 2 16 |
| 89 | උඩකුරුදුගොල්ලේවත්ත | කුරුදුගොල්ලේ පදිංචි සමරසේකරහේරත්මුදියන්සේලාගේ උක්කුබන්ඩා | වත්ත | .. 0 3 2 |
| 91 | එම .. | පාර්ගම කලබුල්ලන්දේ පාඨශාලාවේ පදිංචි පියනපල්ලියගේ අලෝසියානුෂ්ගේ දරුවෝ | එම | .. 0 2 8 |
| 94 | එම .. | කුරුදුගොල්ලේ පදිංචි සමරසේකරහේරත්මුදියන්සේලාගේ බද්දේරාල | එම | .. 0 0 24 |
| 96 | එම .. | කුරුදුගොල්ලේ පදිංචි සමරසේකරහේරත්මුදියන්සේලාගේ තින්මැනිකේ | එම | .. 0 0 18 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින කෑගල්ලේ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජැන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කළුතර දිස්ත්‍රික්කයේ හොරණ සනීපාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් සහ ආරෝග්‍ය ශාලාවක් පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ (203 පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට පලාත් පාලන කාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් ලැබී තිබෙන බලය නිසා එම කාරක සභාවෙන් නිසියාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 1,486. ගම—හොරණ (කොටසක්).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | රළහාමිගේවත්ත, රත්නපුර පාරේ වරිපණම් අංක 204 සහ 204/1 දරණ | පොල්ගස් 11ක්ද, පුවක්ගස් 6ක්ද, කොස්ගහක්ද, දෙඹගස් 2ක්ද, උළුසෙවිලිකළ කපරාරු කරනලද කොඩනැගිල්ලක්ද, සින්ක්තහඩු වහලට ගසනලද කපරාරුකල ගරාජ් එකක්ද, වහල කොන්ක්‍රීට්වලින් ඇති කක්කුස්සි 2ක්ද, කපරාරුකළ ළිඳක්ද ඇති ඉඩම | උඩුවර පදිංචි කරණමුනි ජෝදිලිස් ද සිල්වා | 0 1 8·5 |

එබැවින් ඉහත අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බිම් පොලුන්නාගෙම් දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ මනැකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම කැමැත්ත නොහොත් කමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ නොවැම්බර් මස 19වෙනි දින උදේ 10.30යේ කච්චේරියට හොරණ කානායමේදී මා ඉදිරියටවට පැමිණ ඒ ඉඩමේ අන්දමේ අයිතිවාසිකම්ද කියා තියාසිටින්ට ඔහුමා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ කමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඔහු බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 16වෙනි දින කළුතර කච්චේරියේදීය.

ජී. ආර්. ඩබ්ලිව්. ද. සිල්වා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුව.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3යේ ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ආරක්‍ෂක කටයුතු පිළිබඳ මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරන පිණිස "ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ 203වෙනි පරිච්ඡේදයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගෝර්තුවල ප්‍රකාරයට පලාත් පාලක ඇමති මණ්ඩලයෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 860. ගම—කතළුවේ මොදර මෙගොඩහ.

වර්ෂ 1942ක්වූ නොවැම්බර් මස 19වෙනි දින.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 93 | මෝදරඅඳීරවතත | අවුරුදු 40–50ක්වූ පොල්ගස් 5ක්ද, අවුරුදු 2–10ක්වූ පොල්ගස් 3ක්ද, $19' \times 19'$ දිග පලල ඇති සදහකාලිකව පැවැතීමට තනනලද කඩයක් ඇති ඉඩම | පොල්අතුමෝදර පදිංචි ගාර්දියවැලි ගමගේ බඹුන්නෝනා, තලේම නනාරමේ පදිංචි ලංකා දුම්රථ දෙපාර්තමේන්තුවේ කාර්යාලයෙහි නියුක්ත හෙට්ටිහේවාගේ ඩේවිඩ් සිල්වා, මාතර පදිංචි ඇස්. එච්. ඒ. වෛද්‍යසාගර සහ දික්කුඹුරේ පදිංචි හෙට්ටිහේවාගේ අල්ලිස් සිල්වා | 0 0 9·5 |
| 94 | සූරියගහවත්ත .. | අවුරුදු 10–45ක්වූ පොල්, දෙල් සහ කිතුල්ද, සදහකාලිකව පැවතීමට තනනලද ගෙවල් 5ක්ද, ($14' \times 14\frac{1}{2}'$ දිග පලල ඇති පෝටිකෝ එකකින්යුක් $30\frac{1}{2}' \times 29\frac{1}{2}'$ක් දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද ගෙයක්ද, $8\frac{1}{2}' \times 12\frac{1}{4}'$ක් දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද කුස්සියක්ද, $16\frac{3}{4}' \times 13\frac{1}{4}'$ දිග පලල ඇති තාවකාලිකව සාදනලද ගෙයක්ද, $6\frac{3}{4}' \times 3\frac{1}{4}'$ දිග පලල ඇති තාවකාලිකව සාදනලද වැසිකිලියක්ද, $25\frac{3}{4}' \times 24\frac{3}{4}'$ක් දිග පලල ඇති සදහකාලිකව තනනලද ගෙයක්ද, $22\frac{3}{4}' \times 22\frac{1}{2}$ක් දිග පලල ඇති සදහකාලිකව තනනලද ගෙයක්ද, $28' \times 22\frac{3}{4}'$ දිග පලල ඇති සදහකාලිකව තනනලද ගෙයක්ද, $21\frac{1}{2} \times 21'$ක් දිග පලල ඇති සදහකාලිකව තනනලද ගෙයක්ද,) ($14\frac{1}{2}' \times 17\frac{3}{4}' \times 18\frac{1}{4}' \times 17\frac{3}{4}'$) දිග පලල ඇති අර්ධ සදහකාලිකව තනනලද ගෙයක්ද), $14\frac{1}{2}' \times 8'$ දිග පලල ඇති තාවකාලිකව සාදනලද කුස්සියක්ද, ($24\frac{1}{2}' \times 12'$, $10\frac{1}{2}' \times 12\frac{1}{2}$, $17\frac{3}{4}' \times 15\frac{3}{4}'$) දිග පලල ඇති තාවකාලිකව සාදනලද ගෙවල් 3ක් ඇති ඉඩම | වැලිගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ ලැයිසිහාමි, ගාර්දියපුංචිහේවාගේ පුංචි නෝනා, අහංගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ ගුණවතී, අහංගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ සයිමන් සිල්වා, වෛද්‍යසේන, ගාර්දියපුංචිහේවාගේ සයිමන් අප්පු, ගාර්දියපුංචිහේවාගේ පීරිස් සිඤ්ඤෝ, ගාර්දියපුංචිහේවාගේ දවිත් සිඤ්ඤෝ, අහංගම පදිංචි සල්පදොරු තුප්පහිගේ බාලහාමි, පුංචිහේවාගේ ආර්ලිස්අප්පු, පුංචිහේවාගේ දවිත්හාමි, කරුණාරත්න මුහන්දිරම් ගන්හේවා, ගාර්දියවැලිගමගේ පුංචිනෝනා, වැලිගම පදිංචි ගුණසේන මුහන්දිරම්, වැලිකොන්ඩෙහි පදිංචි පුංචිහේවාගේ පුංචිනෝනා, ගාර්දියපුංචිහේවාගේ පොඩිනෝනා, ගල්බොක්කෙහේවාගේ ජේන් නෝනා, කතළුවේ පදිංචි පී. ඩී. ඇස්. ජී. පුංචිහේවා | 0 2 26·1 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 95 | දෙල්ගහවත්ත .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 8ක්ද, අවුරුදු 40ක්වූ දෙල්ගස් දෙකක්ද, අවුරුදු 1–2ක්වූ දෙහිගස් 9ක්ද, $28\frac{3}{4}' \times 28\frac{1}{4}'$ක් දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද ගෙවල් එකක්ද, $6' \times 5\frac{1}{2}'$ක් දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද වැසිකිලියක්ද, $10\frac{1}{2}' \times 8\frac{1}{2}'$ දිග පලල ඇති තාවකාලිකව පැවතීමට තනනලද මඩුවක් ඇති ඉඩම | අහංගම පදිංචි කරුණාරත්න මුහන්දිරම් ගන්හේවා | 0 | 0 | 19·3 |
| 96 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 16ක්ද, අවුරුදු 6–15ක්වූ පොල්ගස් 3ක්ද, අවුරුදු 40ක්වූ දෙල්ගස් 4ක්ද, $18\frac{1}{2}' \times 17\frac{3}{4}'$ක් දිග පලල ඇති තාවකාලිකව සාදනලද ගෙයක් ඇති ඉඩම | මාකාල්ලේ පදිංචි සිබල් විජේසූරිය, අහංගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ ආර්ලිස් සිල්වා | 0 | 0 | 33·5 |
| | | වම 1942ක්වූ නොවැම්බර් මස 20වෙනි දින. | | | | |
| 97 | ගල්පුරඅද්දරදත්ත | අවුරුදු 45ක්වූ පොල්ගස් 1ක්ද, අවුරුදු 40ක්වූ දෙල්ගස් 1ක් ඇති ඉඩම | අහංගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ ආර්ලිස් සිල්වා | 0 | 0 | 5·5 |
| 98 | ගල්පපුරඅද්දර හොබැල්ලේවත්ත | අවුරුදු 45ක්වූ පොල්ගස් 3ක්ද, අවුරුදු 12ක්වූ පොල්ගස් 2ක්ද, අවුරුදු 30ක්වූ දෙල්ගස් 1ක්ද, $8' \times 9\frac{1}{2}'$ දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද වැසිකිලියක් ඇති ඉඩම | අහංගම පදිංචි තල්ගස්දූවගේ නෝනිස් සිල්වා | 0 | 0 | 7·8 |
| 99 | ගල්පපුරවත්ත .. | අවුරුදු 45ක්වූ පොල්ගස් 5ක්ද, අවුරුදු 3–12ක්වූ පොල්ගස් 6ක්ද, අවුරුදු 25–30ක්වූ දෙල්ගස් 5ක්ද, $37' \times 22\frac{1}{2}'$, $(21\frac{3}{4}' \times 21' + 24' \times 21')$ දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද ගෙවල් 2ක්ද, $6\frac{1}{2}' \times 13\frac{1}{4}'$, $8' \times 6'$ දිග පලල ඇති තාවකාලිකව සාදනලද කුස්සි 2ක්ද, $8' \times 6\frac{1}{2}'$ක් දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද වැසිකිලියක්ද, $12' \times 10\frac{1}{2}'$ක් දිග පලල ඇති පරන ගෙයක බිත්ති ඇති ඉඩම | අහංගම පදිංචි ගාර්දියවැලිගමගේ එලිසා හාමි, ගාර්දියවැලිගමගේ සැමියෙල් සිල්වා, රාතල පදිංචි ගාර්දියවැලිගමගේ ජිනදාස, බලංගොඩ පදිංචි තල්ගස්දූවගේ නොනහාමි | 0 | 0 | 27·6 |
| 100 | ගල්පපුරඅදූරවත්ත | අවුරුදු 40ක්වූ පොල්ගස් 11ක් ඇති ඉඩම | කතළුවේ පදිංචි ගාර්දියවැලිගමගේ ජීරිස් සිල්වා, ගන්දර පදිංචි ගාර්දියවැලිගමගේ මොරීසන් සිල්වා | 0 | 0 | 12·2 |
| 101 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 13ක්ද, අවුරුදු 2ක්වූ පොල්පැල 2ක්ද, අවුරුදු 15ක්වූ දෙල්ගස් 2ක් ඇති ඉඩම | ඔරගොඩ පදිංචි ලමාහේවාගේ බස්තියන් සිල්වා, අහංගම පදිංචි තෙලිජ්ජවිල දියගුබඩතුරගේ නෝනාහාමි | 0 | 0 | 10·3 |
| 102 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 4ක් ඇති ඉඩම | කතළුවේ පදිංචි ගාර්දියවැලිගමගේ ජීරිස් සිල්වා | 0 | 0 | 5 |
| 103 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 3ක්ද, අවුරුදු 15ක්වූ පොල්ගස් 4ක්ද, අවුරුදු 2ක්වූ පොල්පැල 6ක්ද, කරප්පයක්ද, $15\frac{3}{4}' \times 16\frac{1}{2}'$ක් දිග පලල ඇති අංසයකින් යුත් $44\frac{1}{2}' \times 26'$ දිගපලලඇතිසදහකාලිකව පැවතීමට තනනලද ගෙයක් ඇති ඉඩම | ගන්දර පදිංචි ගාර්දියවැලිගමගේ මොරීසන් සිල්වා | 0 | 0 | 17·8 |
| 104 | එම .. | අවුරුදු 5–15ක්වූ පොල්ගස් 3ක්ද, අවුරුදු 40ක්වූ පොල්ගස් 5ක්ද, අවුරුදු 30ක්වූ දෙල්ගස් 2ක්ද, $20' \times 12\frac{1}{2}'$ දිග පලල ඇති පරනවූ සදහකාලිකව සාදනලද ගෙයක් ඇති ඉඩම | ගන්දර පදිංචි ගාර්දියවැලිගමගේ මොරීසන් සිල්වා, කතළුවේ පදිංචි ගාර්දියවැලිගමගේ ජීරිස් සිල්වා | 0 | 0 | 4·9 |
| 105 | එම .. | අවුරුදු 2ක්වූ පොල්පැල 2ක්ද සහ අවුරුදු 2ක්වූ දෙල්ගස් 1ක් ඇති ඉඩම | මීරිස්ගේ හන්වැල්ලේ පදිංචි ලමාහේවාගේ සල්මන් සිල්වා | 0 | 0 | 4·5 |
| | | වම 1942ක්වූ නොවැම්බර් මස 23වෙනි දින. | | | | |
| 106 | ගල්පපුරේගොඩැල්ලේවත්ත | අවුරුදු45ක්වූපොල්ගස්6ක්ද, අවුරුද්දක්වූ පොල්පැල 16ක්ද, අවුරුද්දක්වූ දෙල් ගසක්ද, අවුරුදු 3ක්වූ දෙහිගසක්ද ඇති ඉඩම | උනාවටුනේ පදිංචි ගාර්දියවැලිගමගේ පොඩිහාමි | 0 | 0 | 8 |
| 107 | ගල්පපුරඅද්දර ගොඩැල්ලේවත්ත | අවුරුදු 45ක්වූ පොල්ගස් 5ක්ද, අවුරුදු 6ක්වූ දෙල්ගස් එකක් ඇති ඉඩම | අහංගම පදිංචි දියගුබඩතුරුගේ දනෝරිස් සිල්වා, ගාර්දියවැලිගමගේ සයිමන්රිස් සිල්වා, උනාවටුනේ පදිංචි ගාර්දියවැලිගමගේ පොඩිහාමි, අහංගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ චාර්ලින් ද සිල්වා, තෝප්පමූව පදිංචි ගාර්දියපුංචිහේවාගේ මාටින් සිල්වා | 0 | 0 | 10·7 |
| 108 | ගල්පපුරඅදූරවත්ත | අවුරුදු 40ක්වූ පොල්ගස් 4ක්ද, අවුරුදු 30ක්වූපොල්ගස්4ක්ද, අවුරුදු5ක්වූපොල් ගස් 5ක්ද, අවුරුදු 10ක්වූ දෙල්ගසක්ද, $42\frac{1}{4}' \times 41\frac{3}{4}'$ දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද ගෙයක්ද, $16' \times 12\frac{1}{2}'$ දිග පලල ඇති අති සදහකාලිකවූ කුස්සියක්ද, $7' \times 5\frac{1}{2}'$ දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද වැසිකිලියක්ද ඇති ඉඩම | උනාවටුනේ පදිංචි ගාර්දියවැලිගමගේ පොඩිහාමි | 0 | 0 | 20·6 |
| 109 | එම .. | අවුරුදු40ක්වූපොල්ගස් 2ක්ද, අවුරුදු3ක්වූ පොල්පැලයක්ද, $38\frac{1}{4}' \times 24'$ දිග පලල ඇති සදහකාලිකව පැවතීමට තනනලද ගෙයක් ඇති ඉඩම | කතළුවේ පදිංචි ගාර්දියවැලිගමගේ සිංඤෝ අප්පු | 0 | 0 | 8·5 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 110 | ගල්පදුරඅද්දරසූරිය ගහමිත්ත | අවුරුදු 30ක්වූ පොල්ගස්ද, දෙල්ගස්ද, පුවක්ගස්ද, 26½′×18¾′, 16½′×15¼′, 32′×31½′, 22¾′×15¾′, දිග පලල ඇති සදහකාලිකව පැවතීමට සාහනලද ගෙවල් 4ක්ද, ගල්බැම්මෙන් කල ලිදක්ද, පාළුවූ ලිදක් ඇති ඉඩම | අහංගම පදිංචි ගාර්දියවැලිගමගේ සෙනියේරිස් සිල්වා, උනවටුනෙන් පදිංචි ගාර්දියවැලිගමගේ පොඩිහාමි, අහංගම පදිංචි දියගුබඩතුරුගේ දනෝරිස් සිල්වා, අහංගම පදිංචි ගාර්දියපුංචිහේවාගේ වාර්ලින් සිල්වා, පොලොන්නරුවේ පදිංචි ගාර්දියපුංචිහේවාගේ මාටින් සිල්වා, අහංගම පදිංචි ගාර්දිය පුංචිහේවාගේ බස්තියන් සිල්වා | 0 1 1·7 |
| 111 | ගල්පදුරඅද්දරවත්ත | අවුරුදු 15–40ක්වූ පොල්ගස් 11ක්ද, 10½′×8½′, දිග පලල ඇති තාවකාලිකව තනනලද මඩුවක් ඇති ඉඩම | කතළුවේ පදිංචි ලම්බාහේවාගේ සලමන් සිල්වා | 0 0 9·1 |
| 112 | එම | අවුරුදු 40ක්වූ පොල්ගස් 2ක්ද, අවුරුදු 12ක්වූ පොල්ගස් 1ක්ද, 12′×12′ක් දිග පලල ඇති තාවකාලිකව සාදනලද කඩයකින් කොටසක් ඇති ඉඩම | ගන්දර පදිංචි ගල්බොක්කේහේවාගේ සවුන්දියස් සිල්වා | 0 0 1·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැම්දෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය ඉහත සඳහන් දිනවල පෙරවරු 9.30ට පටන් කාලිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ආණ්ඩුවේ ඒජන්ත වසීහ.

---

## රජසන්තක රබර් ඉඩම් බදුදීම.

LW 5265

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1943ගේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රීජිස්ටර් කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර්ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැනීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලක් ඉල්ලුම්පත්‍ර මේ 1942ක්වූ නොවැම්බර් මස 18වෙනි දින පෙරවරු 10 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් ඔහු බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් ¼ කොටසක් එවලේම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් 1943ගේ ජනවාරි මස පළමුවෙනිදට මත්තෙන් ගෙවන්ට ඕනෑය.

5. කැලෑවට යන්වනොදී ඉඩම් හොඳ අන්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැළැක්විය යුතුය.

7. බද්ද අවසානවූ විගාම හෝ අවලංගුකලවිට බදුකාරයා වගාවට අනතුරුනොකර ඉඩම් නිරවුල්ව භාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරනා රබර්පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර්පාලකතුමා විසින් නියමකළහොත් ඉඩම් පරීක්ෂාකිරීමට සහ සාක්ෂ්සෙරුකිරීමට යන මුදලක් බදුකාරයා විසින් ගෙවිය යුතුය.

10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

මේ 1942ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

| අංක. | රෙජිස්ටර් අංක. | ගම | ඉඩම්වල විස්තර. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | | | කුකුළුකෝරලය. | |
| 1 .. | 194S3R176 | .. පරගල | .. ලොට් 357B, F. V. P. 244 .. | .. 0 2 0 |
| 2 .. | — | .. ගවරගිරිය | .. ලොට් 200D, F. V. P. 41 .. | .. 0 1 6 |
| 3 .. | — | .. පරගල | .. ලොට් 216G (කොටසක්), F. V. P. 224. | 0 2 0 |
| | | | කුරුවිටිකෝරලය. | |
| 4 .. | 193AS1R116 | .. දෙසියාගල | .. ලොට් අංක. 44 (කොටසක්), F. V. P. 711 | .. 0 1 0 |
| 5 .. | — | .. සුදුගල | .. ලොට් 24A, F. V. P. 329 .. | .. 1 0 1 |
| | | | නවදුන්කෝරලය. | |
| 6 .. | — | .. කරවිට | .. ලොට් 121, 122 සහ 124 (කොටස්), F. V. P. 39 | .. 1 0 0 |
| | | | අටකලන්කෝරලය. | |
| 7 .. | — | .. කොට්වල | .. ලොට් 81 (කොටසක්), V. P. 613 .. | .. 0 2 0 |

---

## මැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### ආණ්ඩුවේ මැණික් ඉඩම් බදුදීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක්තුළ මැණික් කැරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් කැරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මේ 1942ක්වූ නොවැම්බර් මස 17වෙනි දින පෙරවරු 10.30ට වනතුරු භාරගනිමින් කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් ඔහු බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරමින්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාසයක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තොයි නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලයතුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාර නොගැනීමේද ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම් වැලක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බදින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩපටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්ෂකතුමා සකල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

11. මැඩිදුර කාරණා සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

ඉඩම්වල තොරතුරු.

(1) කුකුළුකෝරලේ දෙල්ගොඩ පිහිටි දිගින් දම්වැල් 20ක් සහ පලලින් අඩි 35ක් පමණ විශාලකම ඇති කොස්වත්ගේ ගගට මායිම්:—

උතුරට: දකුණු ඉවුරද,
නැගෙනහිරට: ලොට් නො. 53හේ මායිම්ද,
දකුණට: වම් ඉවුරද,
බස්නාහිරට: කොහොලාන්කන්ඇල කොස්වතුගගට වැටෙ ස්ථානයද.

(2) කුකුළුකෝරලේ ඔබොක්කේ පිහිටි පාන්දුරේගොඩගහ හේන, යාගලගොඩහේන, අල්හේන නො. 247 පැලෑනේ ලොට් නො. 66 බ්ලොක් නො. A, අක්කරයක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම්:—

උතුරට: එම ඉඩමේ ඉතුරු කොටස,
නැගෙනහිරට: බ්ලොක් B.,
දකුණට: දෙලට අත්හැරිය කොටස,
බස්නාහිරට: දෙලට අත්හැරිය කොටස.

(3) කුකුළුකෝරලේ ඔබොක්කේ පිහිටි පාන්දුරේගොඩගහ හේන, යාගලගොඩහේන, අල්හේන නො. 247 පැලෑනේ ලොට් නො. 66 බ්ලොක් නො. B. අක්කරයක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම්:—

උතුරට: එම ඉඩමේ ඉතුරු කොටස,
නැගෙනහිරට: නො. 247 පැලෑනේ ලොට් නො. 74,
දකුණට: දෙලට අත්හැරිය කොටස,
බස්නාහිරට: බ්ලොක් A.

(4) කුරුවිටිකෝරලේ ගුරුළුවාන පිහිටි කොකැටියාවලේ ඔවිට නො. 349 පැලෑනේ ලොට් නො. 236 රූඩ් 1යි, පර්චස් 37ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම්:—

උතුරට: ආණ්ඩුවේ ඉඩම්ද,
නැගෙනහිරට: ඉන්දුරුගහ,
දකුණට: ඉන්දුරුගහ,
බස්නාහිරට: ආණ්ඩුවේ ඉඩම්ද.

ඉන්දුරුගහට අඩි 15ක් වටේට අත්හැරිය යුතුයි.

(5) කුරුවිටිකෝරලේ මුදුන්කොටුවේ පිහිටි දිගින් දම්වැල් 60ක් පමණ විශාලකම ඇති එල්ලාවලගගට මායිම්:—

උතුරට: මහඇල වැටෙන ස්ථානය සහ ලොට් නො. 257ද,
නැගෙනහිරට: වම් ඉවුරද,
දකුණට: කුරුගග වැටෙන ස්ථානය,
බස්නාහිරට: දකුණු ඉවුරද.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

කොටුපල් රේන්ද විකිනීම.

වර්ෂ 1943ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසානවන අවුරුද්ද‍ට දිග්ගල කොටුපල් රේන්දය මිලයටගැනීම පිණිස ඉල්ලුම්පත්‍ර වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින පෙරවරු 11ට කොළඹ කච්චේරියේදී දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා විසින් භාරගනු ලැබේ. සියලුම ඉල්ලුම්පත්‍ර ඒ සඳහා පිළිවෙලකර තිබෙන කොලවල ලියාදිය යුතුය. ඉල්ලුම්පත්‍රවලට පාවිච්චිකරන කොල සහ විකිනීම සම්බන්ධව කොන්දේසි යනාදිය කොළඹ දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවට පැමිණීමෙන් ලබාගන්ට පුළුවන.

ජී. ඇම්. මිත්‍රනම්බි,
කොමිටියේ ප්‍රධානතැන වෙනුවට.

වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින
කොළඹ දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවේදීය.

දිස්ත්‍රික් රෝඩ් කොමිටි පිළිබඳ දැන්වීමයි.

මංමාවත් ආඥාපනතේ (148වෙනි පරිච්ඡේදය) 24වෙනි වගන්තිය ප්‍රකාර පුත්තලම්-හලාවත දිස්ත්‍රික් රෝඩ් කොමිටියට එරෙප්පාකාර, බර්ගර් සහ ස්වදේසක්කාර සභාකාර තනතුරට පැමිණීමට කැමතිව සිටින අය තමුන් එසේ කල්පනාකර තිබෙන බව තෝරාගැනීමේ දිනයට දස දවසක් ප්‍රථමයෙන් වයඹ දිසාවේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැනට ලියවිල්ලකින් දැනුම්දෙන්ට ඕනෑ බව මෙයින් දන්වනවාය. වර්ෂ 1942ක්වූ නොවැම්බර් මස 24වෙනි දිනදී පෙරවරු 10ට පුත්තලමේ කච්චේරියේදී තෝරාගන්ට යෙදෙනවා ඇත.

ඒ. ඒ. ගොඩසිංහ,
සෙක්‍රතාරිස් වශයෙන්.

වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දින
කුරුණෑගල ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ
කන්තෝරුවේදීය.

සුප්‍රීම් උසාවියේ දැන්වීමයි.

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1942ක්වූ නොවැම්බර් මස 16වෙනි දින පෙරවරු 11 පැය පටන් කළුතර තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

එම්. සී. විජේසිංහ,
බ. ප. පිස්කල් වෙනුවට.

වර්ෂ 1942ක්වූ ඔක්තෝබර් මස 16වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

අන්‍ය දැන්වීමයි.

යාපනේ පුංගුඩුදිවනි පදිංචි සුපපරමනියම් රත්නසිංගම් වන මම යාපනේ දිස්ත්‍රික්කය තුල දෙමළ භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙක් මෙන් කටයුතු කිරීම සඳහා ඇතුලත් කිරීම පිණිස ඉල්ලුම්කිරීමට අදහස්කරන බව මෙයින් දැනුම් දෙමි.

ඇස්. රත්නසිංගම්,

19. 10. 42.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.